පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## කෘෂි හා ආහාර තාක්ෂණය - I , II

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ................................ කාලය : පැය 03

### I පත්‍රය

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න**

1) කුඹුරු ලක්ෂයක් තිබුණු නිසා වෙල්ලස්ස ලෙස ජනප්‍රවාදයේ සඳහන් පළාත වන්නේ

   i) ඌව පළාත ii) වයඹ පළාත
   iii) දකුණු පළාත iv) සබරගමු පළාත

2) පෘතුගීසීන් හා ලන්දේසීන් ඔවුන් විසින් පරිභෝජනයට ගත් ලංකාවට හඳුන්වාදුන් බෝග වන්නේ

   i) පොල්, මිරිස්, රඹුටන් ii) අන්නාසි, පැපොල්, රඹුටන්
   iii) දෙල්, පොල්, වී iv) වී,මෙනේරි, අන්නාසි

3) කලාවැවේ සිට තිසාවැවට ජලය ගෙන යන යෝධ ඇල නිර්මාණය කළ රජතුමා වන්නේ

   i) මහසෙන් රජතුමා ii) ධාතුසේන රජතුමා
   iii) දුටුගැමුණු රජතුමා iv) පරාක්‍රමබාහු රජතුමා

4) ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා හිතකර වූ පරිසර තත්ත්ව පැවතීම ඉතා වැදගත් ය. නිවැරදි පරිසර තත්වයන්ට අයත් කාණ්ඩය

   i) වර්ෂාපතනය හා භූමියයි ii) වර්ෂාපතනය හා ජලය
   iii) වර්ෂාපතනය හා ශ්‍රමය iv) වර්ෂාපතනය හා භූ විෂමතාවය

5) සියලුම බෝග සඳහා පොහොර සහනාධාරය ලබාදීම ආරම්භ කරන ලද වර්ෂය වන්නේ

   i) 2010 ii) 2011
   iii) 2012 iv) 2014

6) හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දක්වා ඇත.

   A – වැඩි දියුණු කළ බෝග ප්‍රභේද හඳුන්වාදීම
   B – අපි වවමු රට නගමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
   C - කෘෂි රසායන ද්‍රව්‍ය හඳුන්වාදීම හා භාවිතය වැඩි වීම

   ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ

   i) AB ii) AC
   iii) BC iv) ABC

7) යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය වන්නේ

   i) දේශගුණය ii) ආර්ද්‍රතාවය
   iii) ආලෝකය iv) කාලගුණය

8) යල කන්නයේ අස්වනු නෙලන මාසය වන්නේ

   i) ජනවාරි ii) පෙබරවාරි
   iii) අගෝස්තු iv) සැප්තැම්බර්

9) ඊසාන දිග මෝසම් සුළඟ මඟින් වැසි අපේක්ෂා කළ හැක්කේ කුමන මාස වලදීද

i) මැයි සිට සැප්තැම්බර් දක්වා
ii) නොවැම්බර් සිට පෙබරවාරි දක්වා
iii) මාර්තු අප්‍රේල් මාසවලදී
iv) ඔක්තෝම්බර් නොවැම්බර් මාසවලදී

10) රතු ආලෝකය උපකාරී වන්නේ

i) බීජ ප්‍රරෝහනය හා අතු බෙදීම
ii) ප්‍රභාසංශ්ලේෂණය සඳහා
iii) පර්ව හා බීජාධරය වර්ධනය සඳහා
iv) පුෂ්ප හට ගැනීම හා ඵල ඉදීම

11) ඇරිකේසියේ කුලයට අයත් බෝගයක් වන්නේ

i) අඹ
ii) ඉඟුරු
iii) රබර්
iv) පොල්

12)

| A | B | C | D |
|---|---|---|---|
| රාබු | බටු | කරවිල | දඹල |
| කැරට් | මිරිස් | පතෝල | බූෂිටා මෑ |
| ගෝවා | තක්කාලි | පිපිඤ්ඤා | හවරි මෑ |

මේ අතරින් අවුලක පෝරා කුරුමිණියා හානිකරන බෝග කාණ්ඩය වන්නේ

i) A ය
ii) B ය
iii) C ය
iv) D ය

13) ප්‍රෝටීන ලබාදෙන බෝග කාණ්ඩය වන්නේ

i) A ය
ii) B ය
iii) C ය
iv) D ය

14) පුෂ්ප හට ගැනීම සඳහා දිවා කාලයේ දිග බලපායි. කෙටි දිවාකාලයක් අවශ්‍ය වන බෝග වන්නේ

i) බීට්, කැරට්, රාබු
ii) උක්, කෝපි, මුං
iii) පොල්, මිරිස්, කව්පි
iv) රාබු, කෝපි, මිරිස්

15) මුහුදු මට්ටමේ සිට උච්චත්වය 900m වැඩි දේශගුණික කලාපය ලෙස සලකන්නේ

i) උඩරට
ii) මැදරට
iii) පහත රට
iv) පහත රට අරමැදි කලාපය

16) WM සංකේතයෙන් හඳුන්වන කෘෂි දේශගුණික කලාපය

i) උඩරට තෙත් කලාපය
ii) මැදරට තෙත් කලාපය
iii) පහත රට තෙත් කලාපය
iv) මැදරට අතරමැදි කලාපපය

17) ආග්නේය පාෂාණ ලෙස සලකනු ලබන්නේ

i) ක්වාට්ස්
ii) හුණුගල්
iii) ෂේල්
iv) වැලිගල්

18) ශාකවල අවශෝෂණය කළ හැකි පස තුල අඩංගු පාංශු ජල කාණ්ඩය වනුයේ

i) ගුරුත්වාකර්ෂණ ජලයයි
ii) කේෂාකර්ෂණ ජලය
iii) ජලාකර්ශණ ජලයයි
iv) උල්පත් ජලය

19) පසෙහි රසායනික ලක්ෂණයකි

i) පාංශු ව්‍යුහය
ii) පාංශු වර්ණය
iii) පාංශු ප්‍රතික්‍රියාව
iv) පාංශු ගැඹුර

20) පසක $P^H$ අගය 5.4 විය. එම පස

i) ප්‍රබල ආම්ලික පසකි　　ii) ප්‍රබල භාෂ්මික පසකි

iii) ආම්ලික පසකි　　iv) භාෂ්මික පසකි

21) ශාකවල වර්ධන විලාසය අනුව බෝග පැළෑටි, පඳුරු, ගස් වශයෙන් වර්ගීකරණය කරයි. ඉහත වර්ගීකරණය පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති බෝග කාණ්ඩය තෝරන්න

i) බණ්ඩක්කා, රඹුටන්, පොල්　　ii) බණ්ඩක්කා, දෙඩම්, රඹුටන්

iii)කෝපි, අන්නාසි, රඹුටන්　　iv) දෙළුම්, රඹුටන්, මිරිස්

22) බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු පාංශු සංඝටක ප්‍රතිශතව නිවැරදිව දක්වා ඇත්තේ

i) ජලය 25% , වාතය 25%, ඛණිජ 40%, කාබනික ද්‍රව්‍ය 10%

ii) ජලය 30% , වාතය 20%, ඛණිජ 25%, කාබනික ද්‍රව්‍ය 25%

iii) ජලය 25% , වාතය 25%, ඛණිජ 45%, කාබනික ද්‍රව්‍ය 5%

iv) ජලය 20% , වාතය 25%, ඛණිජ 45%, කාබනික ද්‍රව්‍ය 10%

23) බණ්ඩක්කා වගාවේ උගුල් බෝගයක් ලෙස කපු කිනිස්ස යොදා ගන්නේ කුමන කෘමියා මර්දනය සඳහා ද?

i) ඉල්මැස්සා　　ii) රතු කපු මකුනා

iii)ගොයම් මැස්සා　　iv) පලතුරු මැස්සා

24) බෝග වගාව සඳහා කරනු ලබන බිම් සැකසීම සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

i) බිම් සැකසීම මගින් බෝග වර්ධනයට පාංශු තත්ව සපයයි

ii) මනාව බිම් සැකසීමෙන් වල් පැළ පාලනය වේ

iii) අතුරුයත් ගෑම සිදුකරන්නේ බෝග සංස්ථාපනයට පෙරය

iv) බිම් සැකසීමෙන් පසේ ජල අවශෝෂණය හැකියාව දියුණු වේ.

25) පොල් වගාවේ දී පැල අතර පරතරය විය යුත්තේ

i) මීටර් 6 x 6　　ii) මීටර් 8 x 8

iii)මීටර් 10 x 10　　iv) මීටර් 12 x 12

26) භ්‍රමණ පෝරුව ලෙස හඳුන්වන්නේ

i) ද්‍රෘති පෝරුව　　ii) තල පෝරුව

iii)රොටංවිටරය　　iv) නැමි පෝරුව

27) තවාන් මිශ්‍රණයේ මතුපිට පස් හා කොම්පෝස්ට් වල අනුපාතය නිවැරදිව දක්වා ඇත්තේ

i) 1:1　　ii) 1:3

iii)1:2　　iv) 2:1

28) අන්තර් ජාතික පාංශු වර්ගීකරණය අනුව මිලිලීටර් 2 ට වඩා විශාල අංශු

i) රොන්මඩ　　ii) මැටි

iii)බොරළු　　iv) සියුම් වැලි

29) පහත දැක්වෙන්නේ ජලවහන කාණු පද්ධතියකි එය හඳුන්වන්නේ



i) උප කාණු යනුවෙනි　　ii) හෙරින්බෝන් කාණු යනුවෙනි

iii)සමාන්තර කාණු යනුවෙනි　　iv) කොඩොල් කාණු යනුවෙනි

30) වී වගාවේ මතුපිට පොහොර ලෙස යොදා ගන්නා TDM(බණ්ඩි පොහොර) වල අඩංගු පෝෂක වන්නේ

i) N හා P　　ii) N හා k

iii) N හා C　　iv) N හා Ca

31) බෝග වගාවේ දී ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) පොහොර බහුලව යොදා ගැනේ. මෙම පොහොරවල අඩංගු $P_2O_5$ ප්‍රතිශතය

i) 20% ii) 27%

iii) 45% iv) 60%

32) බහු වාර්ෂික වල් පැළෑටි පමණක් අයත් කාණ්ඩය වන්නේ

i) කුප්පමේනිය, කලාදුරු, මොනරකුඩුම්බිය ii) ඇත්අඩි, ඇටවරා, කලාදුරු

iii) ගඳපාන, කළාදුරු, කුප්පමේනිය iv) ගොඩමාරුක්, නිදිකුම්බා තුත්තිරි

33) කොම්පෝස්ට් නිපදවීමේ දී අමුද්‍රව්‍යයක් ලෙස යෙදීමෙන් භාස්මිකතාව නිසා අමුද්‍රව්‍ය දිරාපත් වීම ප්‍රමාද වන අතරම, කොම්පෝස්ට් පොහොර වල නයිට්‍රජන් ප්‍රතිශතය ද අඩු වේ. එම අමුද්‍රව්‍ය වන්නේ

i) ජලජ පැළෑටි හා තෘණ ii) පිදුරු හා ගොම

iii) දැව අළු හා අළුහුණු iv) කුකුල් පොහොර

34) වගා භූමියක මිරිස් හා බෝංචි වගාවක පහත රූපිය ලක්ෂණ පෙන්නුම් කරන ලදි.

- පත්‍ර මත අක්‍රමවත් කහ දුඹුරු හෝ කලු පුල්ලි ඇතිවීම
- කලු පුල්ලි එකිනෙක යා වී කළු දුඹුරු පාට කලු පුල්ලි ඇති වීම

ඉහත ලක්ෂණ අනුව එම බෝගවලට වැලඳී ඇත්තේ

i) වද පීදීමය ii) හිටු මැරීමය

iii) ඇන්ත්‍රැක්නෝස්ය iv) පත්‍ර විචිත්‍ර රෝගය

35) පාංශු ක්ෂුද්‍ර ජීවීන්ට උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ

i) ශාක මුල් හා නෙමටෝඩාවන්ය ii) ඇල්ගී හා බැක්ටීරියාවන්ය

iii) කුරුමිණියන් හා බැක්ටීරියාවන්ය iv) කුහුඹුවන් හා ගැඩවිලුන්ය

36) පුෂ්ප මූලාකෘති ඇතිවීමේ සිට පීදීම දක්වා කාලය වී වගාවේ ප්‍රජනක අවධිය ලෙස හඳුන්වයි. එම කාලය වනුයේ

i) දින 20 යි ii) දින 25 යි

iii) දින 30 යි iv) දින 35 යි

37) වැඩි දියුණු කරන ලද වී ප්‍රභේද හා සැසැදීමේ දී ලංකාවේ පාරම්පරික වී ප්‍රබේද පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

i) අස්වැන්න ඉතා වැඩිය ii) ගොයම් ඇදවැටීමට ඔරොත්තු දෙයි

iii) රසායනිනක පොහොර වලට හොඳින් ප්‍රතිචාර දක්වයි iv) සමෝච්ඡ ගල් වැටි දැමීම

38) අධික වර්ෂාවකින් පසු ගලායන වැසි ජලය සමඟ බෑවුම් භූමියක පස් අංශු ප්‍රවාහනය වීම අවම කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියා මාර්ගය වන්නේ

i) පසට වසුන් යෙදීමය ii) වල් පැළෑටි ගලවා දැමීමය

iii) පසට කාබනික ද්‍රව්‍ය එකතුකිරීමය iv) සමෝච්ඡ ගල්වැටි දැමීමය

39) බිත්තර වී ලෙස භාවිතා කිරීමට වඩාත් සුදුසු බීජ සාම්පලයක තෙතමන ප්‍රතිශතය වන්නේ

i) 11% ii) 12%

iii) 13% iv) 14%

40) දුඹුරු පැළ කීඩෑවා පාලනය සඳහා පතිරෝධි ප්‍රබේදයක් ලෙස BG – 352 යන වී ප්‍රබේදය හඳුන්වා දුන් පර්යේෂණ ආයතනය වන්නේ

i) ගන්නෝරුව ii) මහා ඉලුප්පල්ලම

iii) බලංගොඩ iv) හිඟුරක්ගොඩ

## II පත්‍රය

- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුර සපයන්න.**

1) බෝග වගාවේ ඵලදායිතාවය අඩුවීමට එක් ප්‍රබල සාධකයක් ලෙස පලිබෝධ හානි හැඳින්විය හැකිය. එබැවින් පළිබෝධ හානි අවම වන ලෙස පස, ජලය, රෝපණ ද්‍රව්‍ය, පොහොර, යන්ත්‍රෝපකරණ ආදි සම්පත් කළමණාකරණය කිරීම ඉතා වැදගත් ය.

i) පලිබෝධ යනු හඳුන්වන්න

ii) වල් පැළෑටිවල පොදු **ලක්ෂණ දෙකක්** සඳහන් කරන්න

iii) ආක්‍රමණශීලී වල් පැළෑටි සඳහා **උදහරණ** 2 ලියන්න

iv) තවාන් පැළවලට බහුලව වැළදෙන **රෝගයක්** සඳහන් කර එහි **රෝග කාරකයා** නම් කරන්න

v) කෘමි රූපාන්තරයේ ප්‍රධාන ආකාර 2 සඳහන් කර **උදහරණය** බැගින් ලියන්න

vi) පලතුරු මැස්සා හා ඉල් මැස්සා පාලනයට යොදගත හැකි සාර්ථක ක්‍රමයක් ලෙස පහත රූපයේ සඳහන් උපකරණ හැඳින්විය හැකිය.

a – උපකරණය නම් කරන්න

b – A, B, C නම් කරන්න



vii) දුඹුරු පැළ කීඩෑවට ප්‍රතිරෝධ **වී ප්‍රභේද 2 ක්** සඳහන් කරන්න

viii) ශාකයට රෝගයක් වැළදීමට සම්පූර්ණ විය යුතු සාධක 03 කි. ඉන් **දෙකක** සඳහන කරනන

ix) වල් නාශක යෙදිය යුතු අවස්ථාව අනුව වර්ග කළ හැකි **අකාර 2** සඳහන් කරන්න

x) රසායනික වල් නාශක යෙදීමේ දී පිළිපැදිය යුතු **ආරක්ෂක පිළිවෙත් 4** ක් සඳහන් කරන්න

2) අතීතයේ සිට ලංකාව කෘෂි කර්මාන්තය අතින් ස්වයං පෝෂිත වීමට, රාජ්‍ය අනුග්‍රහය , වාරි තාක්ෂණය, ගොවිතැන හා බැඳුණු සංස්කෘතිය යන අංශවල දයකත්වය ඉවහල් වී ඇත.

i) a) මින්නේරි දෙවියන් ලෙස දේවත්වයෙන් පුදනු ලබන රජතුමා නම් කරන්න

b) අනුරාධපුර යුගයේ ඉදිවූ **ප්‍රථම වැව** සඳහන් කරන්න

ii) වැව් ඉදිකිරිමේ තාක්ෂණයේ වැදගත් අංගයක් ලෙස බිසෝකොටුව හැඳින්විය හැකිය. එහි කාර්ය කුමක් ද?

iii) a) ලංකාවට නිදහස ලැබීමෙන් පසු ඇරඹූ සංවර්ධන යෝජනා ක්‍රමවල **පොදු අරමුණු** 4 ලියන්න

b) එල්ලංගා පද්ධතිය යනු කුමක් ද?

c) ලංකාවේ අතීතයේ කෘෂිකර්මාන්තය තිබූ බවට දැක්වෙන **සාක්ෂි 2ක්** ලියන්න

3) පසක් නිර්මාණය වන්නේ පාෂාණවලින් ය. පාෂාණ ජීර්ණය මගින් පාංශු මාතෘ ද්‍රව්‍ය නිර්මාණය වේ. පාංශු මාතෘ ද්‍රව්‍ය තවදුරටත් වෙනස් වී පාංශු ජනනය සිදුවේ.

i) අවසාදිත පාෂාණ සෑදීමේ දී උපයෝගීවන **බන්ධන කාරක** 2 සඳහන් කරන්න.

ii) පාෂාණ භෞතික ජීර්ණය බලපාන **සාධක 4 ක්** ලියන්න

iii) a) ශාකවලට අවශෝෂණය කර ගත හැකි **ජල වර්ගය** නම් කරන්න

b) ලංකාවේ දැයි හැකි පාංශු **ව්‍යුහ ආකාර** 4 අඳින්න

4) යම් කිසි ප්‍රදේශයකට බෝග තෝරා ගැනීමටත් බෝග අස්වනු වැඩි කර ගැනීමටත් එම ප්‍රදේශයේ දේශගුණය හා කාලගුණික පරාමිතීන් දැන සිටීම වැදගත් වේ.

i) යම් ප්‍රදේශයක පවතින කාලගුණික තත්වය ප්‍රකාශ කිරීම සඳහා යොදගන්නා කාලගුණික **පරාමිතීන් 4ක්** ලියන්න

ii) ඔබ ඉහත සඳහන් කල එක් කාලගුණික පරාමිතියක් බෝග වගාවට හිතකරව මෙන්ම අහිතකරව බලපාන ආකාරය දැක්වීමට **කරුණු 2 ක්** සඳහන් කරන්න

iii) a) ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප නම් කර එම කලාප වල **වාර්ෂික වර්ෂාපතනය අගයන්** සඳහන් කරන්න

b) කෙටි දින ශාක , දිගු දින ශාක, උදසීන ශාක වගා කළ යුතු කාලයන් සඳහන් කරන්න.

5) නිවරදි ලෙස බිම් සකස් කිරීමෙන් පසෙහි භෞතික ගුණාංග දියුණු වී ශාකවල මනා වර්ධනයක් සිදු වේ.

i) බිම් සැකසීමේ **ප්‍රධාන පියවර** 2 සඳහන් කරන්න

ii) a) බෝග වගාවේ දී යොදගනු ලබන ප්‍රධාන **පාත්ති වර්ග** 4 සදහන් කරන්න

b) සත්ව බලයෙන් ක්‍රියාකරන **කෘෂි උපකරණ 2ක්** නම් කරන්න.

iii)a) බිම් සැකසීමේ **අරමුණු 2ක්** ලියන්න

b) බීජ වප්කර යනු හඳුන්වන්න

c) බීජ වප්කර සඳහා **උදහරණයක්** ලියන්න

6) බොහෝ බෝග වගා කිරිමේ දී බීජ හෝ වර්ධක කොටස් තවාන් කර ලබාගන්නා පැළ ක්ෂේත්‍රයේ සිටුවන අතර සමහර බෝගවල බීජ එකවරම ක්ෂේත්‍රයේ සිටුවනු ලැබේ.

i) තවානක් සඳහා ස්ථානයක් තේරීමේ දී සැලකිලිමත් විය යුතු **කරුණු 2 ක්** ලියන්න

ii) a) උස් තවානක සම්මත උස, පළල, දිග, තවාන් දෙකක් අතර පරතරය සඳහන් කරන්න.

b) මූල මණ්ඩලයට හානි නොවනසෙ ස් පැල වෙන්කර ගත හැකි තවාන් ක්‍රමය කුමක් ද?

iii)a) වී වගාවේ දී සකසනු ලබන **තවාන් වර්ග** 2 සඳහන් කරන්න

b) තවාන් ජීවානුහරණය කළ **හැකි ක්‍රම 2ක්** ලියන්න

7) ශාකවල පැවැත්ම සඳහා අවශ්‍ය පෝෂක ලබාගනුයේ අවට පරිසරයෙනි. බොහෝමයක් ශාක පෝෂක පසෙන් ද සමහර ශාක පෝෂක වායුගෝලයෙන් ද ලබාගනියි

i) මහාපෝෂක **4ක්** නම් කරන්න

ii) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කළ හැකි **ක්‍රම** 2 සඳහන් කරන්න

iii) a) අලුතෙන් සපයන කොම්පෝස්ට් ගොඩකට මුහුම් ලෙස පරණ කොම්පෝස්ට් පොහොර එකතු කරයි. මෙයට හේතුව සඳහන් කරන්න.

b) ඔබ දන්නා සෘජු පොහොර (අමිශ්‍ර පොහොර ) **වර්ග 2ක් ලියා** එහි අඩංගු පෝෂකය හා පෝෂක ප්‍රතිශතය සඳහන් කරන්න.